අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2005 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2005

ඉතිහාසය I කොටස
History Part I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා

පැය එකයි
One Hour

මෙම කොටසේ ප්‍රශ්න 40ක් ඇත. සියලු ම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි වන්නේ එයින් එකක් පමණි.
ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
මෙම කොටසට ලකුණු 40ක් ලැබේ.
I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.

## I කොටස

- අංක 1 සිට 10 තෙක් වූ ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දක්වා ඇත. ඒවා අතුරෙන් **එකක් පමණක්** අනෙක් නම් සමග **නො ගැළපේ**. එම **නො ගැළපෙන** නම කුමක් දැයි හඳුනාගෙන එහි **අංකය තිත් ඉර මත** ලියන්න.

01. (1) ථූපවංස (2) දීපවංස (3) ධාතුවංස
(4) බෝධිවංස (5) හරිවංස (...........)

02. (1) දඹදෙණිය (2) යාපහුව (3) කුරුණෑගල
(4) නාගදීප (5) කෝට්ටේ (...........)

03. (1) සත්මහල් ප්‍රාසාදය (2) වෛජයන්ත ප්‍රාසාදය (3) ලෝවාමහා ප්‍රාසාදය
(4) නිශ්ශංක-ලතා මණ්ඩපය (5) රාජ සභා මණ්ඩපය (...........)

04. (1) සීවලී (2) සුනේත්‍රා දේවී (3) අනුලා
(4) කල්‍යාණවතී (5) ලීලාවතී (...........)

05. (1) සරජෝතිමාලෙ (2) සද්ධර්මරත්නාවලිය (3) පූජාවලිය
(4) කව් සිළුමිණ (5) සමන්තකූට වණ්ණනා (...........)

06. (1) අදිකාරම් (2) කෝරාළ (3) දිසාවේ
(4) ඕවිදෝර් (5) රටේ මහත්තයා (...........)

07. (1) පළමුවැනි රාජසිංහ (2) විජය රාජසිංහ (3) කීර්ති ශ්‍රී රාජසිංහ
(4) රාජාධිරාජසිංහ (5) ශ්‍රී වික්‍රම රාජසිංහ (...........)

08. (1) මැනිං - ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ (2) කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ
(3) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ (4) මෝර්ලි - මින්ටෝ ප්‍රතිසංස්කරණ
(5) සෝල්බරි ප්‍රතිසංස්කරණ (...........)

09. (1) පෙද්රෝ ලෝපෙස් ද සෞසා (2) දොන් ජෙරනිමෝ ද අසවේදූ
(3) දියෝගෝ ද මේලෝ ද කැස්ත්‍රෝ (4) අන්තෝනියෝ ද සෞසා
(5) ගෙරිට් ද හියරෙ (...........)

10. (1) ඥානාර්ථ ප්‍රදීපය (2) විජයබා කොල්ලය (3) ලක්මිණි පහන
(4) ලංකාලෝකය (5) ලක්රිවි කිරණ (...........)

- අංක 11 සිට 15 තෙක් වූ ප්‍රශ්න සඳහා **පද යුගළ පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගළයක පද එකිනෙකට **නො ගැළපේ**. එම **නො ගැළපෙන** යුගළය කුමක් දැයි හඳුනාගෙන ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති, **තිත් ඉර මත** ලියන්න.

11. (1) අනුරාධගාම - මල්වතු ඔය
(2) උරුවෙල - කලා ඔය
(3) දීඝවාපි - ගල් ඔය
(4) තම්බපණ්ණි - වත නදී
(5) උපතිස්ස ගාම - ගම්භීර නදී (...........)

Past Papers Wiki

12. (1) ෆාහියන් - ටිබෙට් ජාතික සංචාරක භික්ෂුවකි.
(2) සංඝමිත්‍ර - මහසෙන් රජුට උපදෙස් දුන් ඉන්දීය භික්ෂුවකි.
(3) බුද්ධඝෝෂ - ත්‍රිපිටකයට අටුවා ග්‍රන්ථ ලියූ ඉන්දීය භික්ෂුවකි.
(4) ජෝතිපාල - මහා විහාර පාර්ශ්වයේ මතවාද ආරක්ෂා කළ ඉන්දීය භික්ෂුවකි.
(5) වජ්‍රබෝධි - මහායාන ධර්මය ඉගැන්වූ ඉන්දීය භික්ෂුවකි. (...........)

13. (1) තිරුවාලංගාඩු අභිලේඛනය - II රාජාධිරාජ රජු
(2) සම්බණ්ඩාර් කෝවිල් අභිලේඛනය - II ගජබා රජු
(3) විදම්බරම් අභිලේඛනය - III කුලෝත්තුංග රජු
(4) පොළොන්නරුවේ ශිව දේවාල අභිලේඛනය - රාජේන්ද්‍ර චෝළ රජු
(5) ගල්පොත අභිලේඛනය - නිශ්ශංකමල්ල රජු (...........)

14. (1) කුසුමාසන දේවි - දෝන කැතරිනා
(2) ධර්මපාල - දෝන් ජුවන් පෙරිය බණ්ඩාර
(3) කොනප්පු බණ්ඩාර - අවුස්ත්‍රියාවේ දොන් ජුවන්
(4) යමසිංහ බණ්ඩාර - දොන් පිලිප්
(5) කරල්ලියැද්දෙ බණ්ඩාර - දොන් ජුවන් ද කැස්ත්‍රෝ (...........)

15. (1) ක්වේරෝෂ් - ලංකාධිපත්‍යය (The Temporal and Spiritual Conquest of Ceylon)
(2) රිබෙයිරෝ - ලංකා ඉතිහාසය
(3) බැල්දියස් පිලිප්පුස් - යාල්පානම් වෛපව මාලෙ
(4) අලගියවන්න - කුස්තන්තීනු හටන
(5) රොබට් නොක්ස් - එදා හෙළදිව (An Historical Relation of Ceylon) (...........)

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයක් සඳහ නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දක්වා ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුව, X තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග **පහෙන් එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **තිත් ඉර මත** ලියන්න.

16.

| | X | | Y |
|---|---|---|---|
| (i) | කාලිංග මාඝ | A | VI පරාක්‍රමබාහු රජු |
| (ii) | ජටාවර්මන් සුන්දර පාණ්ඩ්‍ය | B | පරාක්‍රම පාණ්ඩ්‍ය රජු |
| (iii) | I රාජරාජ | C | I සේන රජු |
| (iv) | ශ්‍රී මාර ශ්‍රී වල්ලභ | D | II පරාක්‍රමබාහු රජු |
| (v) | අරිකේසරී පරාක්‍රම පාණ්ඩ්‍ය | E | V මිහිඳු රජු |

(1) **BDECA** (2) **BCDEA** (3) **BADEC** (4) **BDCEA** (5) **BACDE** (...........)

17.

| | X | | Y |
|---|---|---|---|
| (i) | VI පරාක්‍රමබාහු රජු | A | පොළොන්නරුව |
| (ii) | V පරාක්‍රමබාහු රජු | B | කෝට්ටේ |
| (iii) | IV පරාක්‍රමබාහු රජු | C | දැදිගම |
| (iv) | II පරාක්‍රමබාහු රජු | D | කුරුණෑගල |
| (v) | I පරාක්‍රමබාහු රජු | E | දඹදෙණිය |

(1) **BDECA** (2) **BCDEA** (3) **BADEC** (4) **BDCEA** (5) **BACDE** (...........)

18.

| | X | | Y |
|---|---|---|---|
| (i) | කැරගල | A | විජයබා පිරිවෙන |
| (ii) | තොටගමුව | B | පද්මාවතී පිරිවෙන |
| (iii) | පැපිලියාන | C | ශ්‍රී ගණානන්ද පිරිවෙන |
| (iv) | දෙවිනුවර | D | සුනේත්‍රාදේවි පිරිවෙන |
| (v) | රයිගම | E | ඉරුගල්කුලතිලක පිරිවෙන |

(1) **BDECA** (2) **BCDEA** (3) **BADEC** (4) **BDCEA** (5) **BACDE** (...........)

| | X | | Y |
|---|---|---|---|
| 19. (i) | මුඩු බිම් පනත | A | 1871 |
| (ii) | ගම්සභා පනත | B | 1840 |
| (iii) | වාරිමාර්ග පනත | C | 1856 |
| (iv) | මහාමාර්ග පනත | D | 1848 |
| (v) | මහනගර සභා පනත | E | 1865 |

(1) **BDECA** (2) **BCDEA** (3) **BADEC** (4) **BDCEA** (5) **BACDE** (...........)

| | X | | Y |
|---|---|---|---|
| 20. (i) | ජී. ජී. පොන්නම්බලම් | A | සිංහල මහ සභාව |
| (ii) | ඩී. ඇස්. සේනානායක | B | දෙමළ කොන්ග්‍රසය |
| (iii) | එන්. එම්. පෙරේරා | C | ලංකා සමසමාජ පක්ෂය |
| (iv) | සී. ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර | D | ජනපද ව්‍යාපාර |
| (v) | එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක | E | නිදහස් අධ්‍යාපනය |

(1) **BDECA** (2) **BCDEA** (3) **BADEC** (4) **BDCEA** (5) **BACDE** (...........)

- අංක 21 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයකට දක්වා ඇති (A), (B), (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය. **නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා**

  (A) සහ (B) පමණක් නිවැරදි **නම්** ............ 1 ද,
  (B) සහ (C) පමණක් නිවැරදි **නම්** ............ 2 ද,
  (C) සහ (D) පමණක් නිවැරදි **නම්** ............ 3 ද,
  (A) සහ (C) පමණක් නිවැරදි **නම්** ............ 4 ද,
  ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි **නම්** .................. 5 ද, **තිත් ඉර මත ලියන්න.**

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

21. වට්ටගාමණී අභය රජුට මුහුණ පෑමට සිදු වූ දුෂ්කරතා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර සාධකය/සාධක නිවැරදි වේ ද ?
    (A) කලිංග මාඝ ආක්‍රමණය (B) තීය බ්‍රාහ්මණයාගේ කැරැල්ල
    (C) මහා සාගතය (D) චන්ද්‍රභානුගේ ආක්‍රමණය (...........)

22. මෝරිය වංශය හා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද ?
    (A) මෝරිය පෙළපතේ ප්‍රභවය අප්‍රකට ය.
    (B) පශ්චාත්කාලීන සම්ප්‍රදායයන්හි මොවුන් ඉන්දියාවේ මෞර්ය අධිරාජ්‍යයන් සමග සම්බන්ධ කර ඇත.
    (C) මෝරිය වංශයට කෙළින් ම සම්බන්ධ අන්තිම රජු වූයේ වසභ ය.
    (D) පොළොන්නරු යුගය අවසානය දක්වා ම මෝරිය රාජවංශය විසින් ශ්‍රී ලංකාව පාලනය කරන ලදී. (...........)

23. පොළොන්නරු යුගයේ ආර්ථිකයට අදාළ ව පහත දැක්වෙන කවර සාධකය / සාධක නිවැරදි වේ ද ?
    (A) මේ යුගයේ දී ඉදිකරනු ලැබූ විශාලතම ජලාශය වූයේ පරාක්‍රම සමුද්‍රයයි.
    (B) ප්‍රමාණයෙන් විශාල වාරිමාර්ග ඉදිකිරීමේ කටයුතු ප්‍රථමවරට ආරම්භ වූයේ මේ යුගයේ දී ය.
    (C) වෙළෙඳාම සංවිධානය කිරීම සඳහා පළමුවන පරාක්‍රමබාහු රජු අන්තරන්ගධුර නම් කාර්යාංශයක් ඇති කළේ ය.
    (D) කලා-මල්වතු ඔය ආශ්‍රිත වාරි පද්ධතිය කණදරා වැව ඉදිකිරීම මගින් මේ යුගයේ දී පුළුල්කරන ලදී. (...........)

24. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර සාධකය / සාධක නිවැරදි වේ ද ?
    (A) ඉංග්‍රීසි අධ්‍යාපනයේ පැතිරීම (B) රෝමානු කතෝලික ආගම හඳුන්වා දීම
    (C) රෝම-ලන්දේසි නීතිය හඳුන්වා දීම (D) ප්‍රොතෙස්තන්තවාදය හඳුන්වා දීම (...........)

Past Papers Wiki

25. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශයේ ප්‍රධාන අවස්ථා සම්බන්ධයෙන් පහත දක්වෙන කවර සාධකය / සාධක නිවැරදි වේ ද ?
(A) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම
(B) විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දීම
(C) කැබිනට් ආණ්ඩුක්‍රමය හඳුන්වා දීම
(D) ජාති මූල නියෝජනය අහෝසි කිරීම (..........)

- අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

26. මුටසීව රජුගේ පුතුන් දහදෙනාගෙන් පස් (05) දෙනෙකුගේ නම් දක්වෙන්නේ මෙයින් කවර ලැයිස්තුවේ ද ?
(1) අභය, තිස්ස, උත්තිය, මහාසිව, මහානාග
(2) අභය, තිස්ස, පණ්ඩුකාභය, උත්තිය, මහානාග
(3) අභය, පණ්ඩුවාසදේව, පණ්ඩුකාභය, අසේල, උත්තිය
(4) අභය, තිස්ස, ගෝඨාභය, මහානාග, අසේල
(5) අභය, තිස්ස, මහානාග, ගෝඨාභය, සූරතිස්ස (..........)

27. පළමුවන පරාක්‍රමබාහු රජුගේ සෙන්පතීන්ගෙන් දෙදෙනෙකුගේ නම් දක්වෙන්නේ මෙයින් කවර ලැයිස්තුවේ ද ?
(1) රවිදේව, සේනාපතිදේව
(2) ලංකාපුර, දණ්ඩනායක කිත්ති
(3) ලංකාපුරදේව, කපිසීස
(4) ලංකාපුර, මිගාර
(5) රවිදේව, ඌස්සදේව (..........)

28. උඩරට ලී කැටයම් කලාව සම්බන්ධයෙන් හොඳ ම උදාහරණ හමුවන්නේ,
(1) හිඳගල විහාරයෙන් ය.
(2) ලංකාතිලක විහාරයෙන් ය.
(3) ඇම්බැක්ක දේවාලයෙන් ය.
(4) ගඩලාදෙණිය විහාරයෙන් ය.
(5) දෙගල්දොරුව විහාරයෙන් ය. (..........)

29. බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ දී ඉදිකරන ලද ප්‍රථම මහා මාර්ගය වූයේ,
(1) කොළඹ - රත්නපුර මාර්ගයයි.
(2) කොළඹ - මහනුවර මාර්ගයයි.
(3) කොළඹ - මාතර මාර්ගයයි.
(4) කොළඹ - මීගමුව මාර්ගයයි.
(5) කොළඹ - යාපනය මාර්ගයයි. (..........)

30. කෝල්බෲක් - කැමරන් කොමිසමේ වැදගත් යෝජනාවක් වූයේ
(1) සර්වජන ඡන්ද බලය හඳුන්වා දීම.
(2) දුම්රිය මාර්ග ඉදිකිරීම.
(3) වියළි කලාපය නැවත ජනාවාස කිරීම.
(4) වාරිමාර්ග කටයුතු නගා සිටුවීම.
(5) අනිවාර්ය රාජකාරි සේවාක්‍රමය අවලංගු කිරීම. (..........)

- අංක 31 සිට 35 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට **නො ගැළපේ**. එම **නො ගැළපෙන** කරුණ තෝරා එහි **අංකය තිත් ඉර මත** ලියන්න.

31. **අනුරාධපුර යුගයේ රාජ්‍ය ආදායම**
(1) රාජ්‍යයේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ ඉඩම් බද්ද ය.
(2) අනුරාධපුර රාජධානි සමයේ මුල් කාලයේ දී මෙම බද්ද "බොජකපති" නමින් හැඳින්විණි.
(3) ජලය පාවිච්චි කිරීම වෙනුවෙන් අය කළ බද්ද "දකපති" නම් විය.
(4) වරායවල වෙළෙඳ කටයුතුවලින් එකතු කරන ලද තීරු බදු ද රජයේ වැදගත් ආදායම් මාර්ගයක් විය.
(5) "මරාල" බද්ද නමින් හැඳින්වුනු බද්දක් ද මේ යුගයේ දී අය කරන ලදී. (..........)

32. **කෝට්ටේ නගරය**
(1) කෝට්ටේ නගරය බිහිවූයේ නිශ්ශංක අලගක්කෝනාර විසින් ඉදි කරන ලද බලකොටුවෙනි.
(2) කෝට්ටේ නගරය ශ්‍රී ජයවර්ධනපුර යනුවෙන් ද හැඳින්විණි.
(3) කෝට්ටේ නගරයේ උපරිම සංවර්ධනය ඇතිවූයේ VI පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ දී ය.
(4) ලන්දේසීහු 1565 දී කෝට්ටේ නගරය අල්වා ගත්හ.
(5) 1551 දී ධර්මපාල කෝට්ටේ රජු බවට පත්විය. (..........)

33. **කෝපි වගාවේ ව්‍යාප්තිය**
(1) කෝපි වගාවේ හිමිකාරත්වය බහුල වශයෙන් ම යුරෝපීයයන් සතු විය.
(2) කෝපි වගාව සඳහා අවශ්‍ය වූ ශ්‍රමිකයින් දකුණු ඉන්දියාවෙන් ගෙන්වා ගන්නා ලදී.
(3) කෝපි වගාව වැඩි වශයෙන් ම පැවතියේ උතුරු පළාතේ ය.
(4) හැමීලියා වැස්ටාට්‍රික්ස් නමැති කෝපි කොළ වසංගත රෝගය නිසා කෝපි වගාව විනාශ විය.
(5) කෝපි වගාවේ ව්‍යාප්තිය නිසා ඉඩම් විකිණීම වර්ධනය විය. (..........)

34. **ශ්‍රී ලංකාවේ මුස්ලිම් දේශපාලන හා සංස්කෘතික පුනර්ජීවනය**

(1) ඔරබි පාෂාගේ අනුග්‍රහය යටතේ අල්-මඩ්රාස්ටුෂ් සහිරා පිහිටුවන ලදී.
(2) සහිඩ් අහමද් ඛාන් විසින් ශ්‍රී ලංකාවේ මුස්ලිම් අධ්‍යාපනය පිහිටුවන ලදී.
(3) වපුචි මරික්කාර් මුස්ලිම් ජාතික පරාර්ථකාමියෙකි.
(4) එම්. සී. සිද්දි ලෙබ්බෙ මුස්ලිම් අධ්‍යාපනය දියුණු කිරීමට ව්‍යාපාරයක් ගෙනගියේ ය.
(5) මුස්ලිම් නෙයිසාන් පුවත්පත මුස්ලිම්වරුන් පිළිබඳ සියලු වැදගත් දේශපාලන සහ සංස්කෘතික කටයුතු හා සම්බන්ධ පුවත් පළ කළේ ය. (..........)

35. **දහනව වන සියවසේ හින්දු පුනර්ජීවනය**

(1) හින්දු ආගමික පුනර්ජීවනයේ ප්‍රථම අදියර ආරුමුග නාවලර් ගේ ක්‍රියාකලාපය හා සම්බන්ධ වේ.
(2) ආරුමුග නාවලර් 1853 දී ශෛව ප්‍රගාෂ සභාව පිහිටු විය.
(3) 1888 දී ශෛව පරිපාලන සභාව ඇති කරන ලදී.
(4) එම සමාගමේ සියලු ම සාමාජිකයෝ පරම විඥානාර්ථ සමාගමේ ආභාසය ලැබූවෝ වූහ.
(5) හින්දු දරුවන්ට ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා 1872 දී ශෛවන්ගල විද්‍යාශාලය ආරම්භ කරන ලදී. (..........)

- පහත දක්වෙන අංක 36 සිට 40 තෙක් වූ ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගළයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගළය දැයි තෝරා ඊට අදාළ **අංකය තිත් ඉර මත ලියන්න.**

වගුව

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2. | නිවැරදි ය. | වැරදි ය. |
| 3. | වැරදි ය. | වැරදි ය. |
| 4. | වැරදි ය. | නිවැරදි ය. |
| 5. | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමු වැන්න මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | සිරිමේඝවර්ණ රජුගේ පාලන සමය ඉතා හොඳින් සිහිපත් කරවන සිද්ධිය වන්නේ දන්ත ධාතූන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවනු ලැබීම ය. | කාලිංග රජුගේ දූ කුමරිය වූ හේමමාල විසින් බැමිණි වෙසින් සැරසී මෙම දන්ත ධාතූන් වහන්සේ මෙහි වැඩම කරවන ලද බව කිය වේ. | (..........) |
| 37. | පොළොන්නරු යුගයේ දී ඉන්දීය සාගරයේ වෙළෙඳ කටයුතුවල ආධිපත්‍යය දරන ලද්දේ පෘතුගීසීන් විසිනි. | නිශ්ශංකමල්ල රජු විදේශීය වෙළෙඳාම වර්ධනය කිරීම සඳහා ක්‍රියා කළ බව දෙවනගල ලිපියේ සඳහන් වේ. | (..........) |
| 38. | 17 සහ 18 වන සියවස්වල දී උඩරට සමාජයේ පැවති ප්‍රධාන ලක්ෂණය වූයේ ජනතාව විවිධ තරාතිරම් හා කුල වශයෙන් ස්ථරගත කර තිබීමයි. | මහනුවර යුගයේ කලාව සහ ගෘහ නිර්මාණ ශිල්පය ශ්‍රී ලංකාවේ සංස්කෘතික ඉතිහාසයේ විශේෂ අවධියක් සනිටුහන් කරයි. | (..........) |
| 39. | 1521 දී "විජයබා කොල්ලයෙන්" පසු ව සීතාවක රාජ්‍යය බිහි විය. | සීතාවක රාජ්‍යයේ පාලකයා වශයෙන් බුවනෙකබාහු රජු පත් කෙරිණ. | (..........) |
| 40. | කැලණි මිටියාවත් දුම්රිය මාර්ගය ගාලු වරාය සමග වතුකරය සම්බන්ධ කළ ප්‍රධාන වාණිජ ගමන් මාර්ගය විය. | අපනයන ආර්ථිකයේ ව්‍යාප්තිය සඳහා වතුකර ප්‍රදේශවල ප්‍රවාහන සංවර්ධනයක් ඇති කිරීම පමණක් නො ව වරායයන් සමග ඒ මාර්ග සම්බන්ධ කිරීම ද අවශ්‍ය විය. | (..........) |

PAST PAPERS WIKI

Past Papers Wiki

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2005 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2005

ඉතිහාසය I කොටස
History Part I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා

පැය දෙකයි
Two Hours

10 වන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න
ප්‍රශ්න අංක 10ට පිළිතුරු සැපයීම සඳහා ලංකාවේ දළ සිතියමක් සපයා ඇත

## II කොටස

01. (i) ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීමේ ප්‍රධාන ලක්ෂණ කවරේ ද ?

(ii) අනුරාධපුර යුගය අවසානය තෙක් එම ලක්ෂණ ශ්‍රී ලංකාවේ ඉතිහාසය කෙරෙහි බල පෑ ආකාරය කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 14 යි.)

02. වාරිමාර්ග ක්ෂේත්‍රයේ වර්ධනයට අනුරාධපුර යුගයේ පාලකයන්ගෙන් සිදු වූ සේවය අගයන්න.

(ලකුණු 14 යි.)

03. "පළමුවන විජයබාහු රජු ශ්‍රී ලංකා ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පාලකයෙකු ලෙස පිළිගනු ලබන්නේ චෝළයින් රජ රටින් පළවා හැර දිවයින එක්සේසත් කිරීම නිසා ම පමණි." මේ ප්‍රකාශය විමසන්න.

(ලකුණු 14 යි.)

04. පොළොන්නරු රාජධානියේ පරිහානියට සහ බිඳ වැටීමට බල පෑ සාධක විචාරාත්මක ව පරීක්ෂා කරන්න.

(ලකුණු 14 යි.)

05. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම දෙකක ඓතිහාසික වැදගත්කම සාකච්ඡා කරන්න.
   (i) දේවානම්පිය තිස්ස රජුගේ පාලන සමයේ දී ශ්‍රී ලංකාවේ බුද්ධාගම පිහිටුවීම.
   (ii) දඹදෙණි යුගයේ සාහිත්‍ය කටයුතු
   (iii) යාපනය රාජ්‍යයේ නැඟීම
   (iv) කෝට්ටේ යුගයේ සංස්කෘතික අභිවර්ධනය

(එක් කොටසකට ලකුණු 07 බැගිනි.)

06. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසි පාලනය සම්බන්ධයෙන් පහත දක්වා ඇති මාතෘකාවන්ගෙන් දෙකක් පිළිබඳ ව විවරණ සපයන්න.
   (i) ක්‍රිස්තියානි මිෂනාරි කටයුතු
   (ii) දේශීය පාලන ක්‍රමයේ ඇති වූ වෙනස්කම්
   (iii) ආර්ථික කටයුතු
   (iv) මහනුවර රාජධානිය සමග පැවති සම්බන්ධතා

(එක් කොටසකට ලකුණු 07 බැගිනි.)

07. 1848 බ්‍රිතාන්‍ය විරෝධී සටනට තුඩුදුන් සාධක විචාරාත්මක ව පරීක්ෂා කරන්න. (ලකුණු 14 යි.)

08. පහත දැක්වෙන මාතෘකාවන්ගෙන් **දෙකක්** තෝරා ගෙන ඒවා බ්‍රිතාන්‍ය පාලන සමයේ වැදගත් වූ ආකාරය පැහැදිලි කරන්න.
   (i) බෞද්ධ අධ්‍යාපනය
   (ii) කෘෂිකර්මය හා වාරිමාර්ග කටයුතු
   (iii) අමද්‍යප ව්‍යාපාරය
   (iv) 1915 සිංහල - මුස්ලිම් කෝලාහලය
   (v) වාමාංශික ව්‍යාපාරය

(එක් කොටසකට ලකුණු 07 බැගිනි.)

09. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පහත දැක්වෙන මාතෘකා කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පරීක්ෂා කරන්න.
   (i) සර්වජන ඡන්ද බලය
   (ii) ආණ්ඩුකාරයාගේ බලතල
   (iii) රාජ්‍ය නිලධාරීන් තිදෙනා
   (iv) විධායක කාරක සභා ක්‍රමය

(ලකුණු 14 යි.)

10. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කර නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳ කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

| | | |
|---|---|---|
| (1) දැදුරු ඔය | (2) අටදහස් රට | (3) පරාක්‍රම සමුද්‍රය |
| (4) මහාතිත්ථ | (5) දෙව්නුවර | (6) මාතලේ |
| (7) මඩකලපුව | (8) යාපනය අර්ධද්වීපය | |


(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.
කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි.)


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2005 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2005

ප්‍රශ්න අංකය 10

විභාග අංකය..........................................................




PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

පැරණි ප්‍රශ්නපත්‍ර සංරක්ෂණ ව්‍යාපෘතිය නොමිලේ බෙදාහැරීම පිණිස පමණි



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library